# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| ත.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 872 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 23/05/2024<br>පැය 0530 |

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයකට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකය.

2024.05.10 වන දින අහුන්ගල්ල පොලිස් වසමේ මරදාන ප්‍රදේශයේ පුද්ගලයෙකුට වෙඩි තබා මනුෂ්‍ය ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධයෙන් පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් විසින් විමර්ශනයක් සිදුකර මෙම අපරාධයේ වින්දිත පුද්ගලයා වූ මරණකරු නිවසේ සිටීද යන්න සම්බන්ධව ඝාතකයන්ට තොරතුරු ලබාදෙමින් එයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු 2024.05.22 වන දින උදෑසන කාලයේ අහුන්ගල්ල පොලිස් වසමේ වැලිකන්ද ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන අහුන්ගල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන වැලිකන්ද, අහුන්ගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

අහුන්ගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාමක් - කැබිතිගොල්ලෑව පොලිස් වසම.

2024.05.22 වන දින අළුයම් කාලයේ කැබිතිගොල්ලෑව පොලිස් වසමේ යකාවැව ලඳු කැලෑ ප්‍රදේශයේදී පුද්ගලයෙකුට විදුලි සැර වැදී මියගොස් ඇති බවට කැබිතිගොල්ලෑව පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක්වූ හල්මිල්ලවැටිය, කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

**වන සතුන් දඩයම් කිරීම සඳහා අනවසරෙන් අදින ලද විදුලි කම්බියක ගැටී මෙලෙස විදුලි සැර වැදී මියගොස් ඇති බවට පොලිසිය සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අනුරාධපුරය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කැබිතිගොල්ලෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.05.22 වන දින ගල්කිස්ස පොලිස් වසමේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීම් 04 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 100 ක් සමඟ සැකකරුවෙකු හා හෙරොයින් ග්‍රෑම් 16 මිලිග්‍රෑම් 800 ක් සමඟ සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25, 29 හා 43 යන වයස්වල පසුවන දෙහිවල හා ගල්කිස්ස ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.05.22 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන හා තෙලවල ප්‍රදේශවලදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 17 ක් මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 26, 49 හා 69 වයස්වල පසුවන රත්මලාන, ගල්කිස්ස හා මොරටුව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පෑලියගොඩ පොලිස් ස්ථානය.**

2024.05.22 වන දින දහවල් කාලයේ පෑලියගොඩ පොලිස් වසමේ පට්ටිය හන්දිය ප්‍රදේශයේදී පෑලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 400 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන කැළණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස බුද්ධි අංශය.**

2024.05.22 වන දින ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස බුද්ධි අංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන කොරලවැල්ල, මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. සැකකටයුතු මරණයක් - ඉංගිරිය පොලිස් වසම.

2024.05.22 වන දින උදෑසන කාලයේදී ඉංගිරිය පොලිස් වසමේ මඩකඩ ප්‍රදේශයේ නිවසක් තුල කාන්තාවක් සැකකටයුතු ලෙස මියගොස් ඇති බවට ඉංගිරිය පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 64 ක්වූ මඩකඩ, ඉංගිරිය ප්‍රදේශයේ පදිංචි මානසික ආබාධ තත්වයකින් පෙළුණු කාන්තාවකි.**

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරික්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරික්ෂණය සඳහා හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ඉංගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. සැකකටයුතු මරණයක් - ගොකරැල්ල පොලිස් වසම.

2024.05.22 වන දින උදෑසන කාලයේදී ගොකරැල්ල පොලිස් වසමේ පල්ලම වැවේ මංකඩ අසල පුද්ගලයෙකු සැකකටයුතු ලෙස මියගොස් ඇති බවට ගොකරැල්ල පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක්වූ ඉපලව,ගොකරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරික්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ගොකරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 09. නිවසක් ගිනි ගැනීමක් - වැලිගම පොලිස් වසම.

2024.05.22 වන දින දහවල් කාලයේ වැලිගම පොලිස් වසමේ ගල්බොක්ක, වැලිගම ලිපිනයේ නිවසක් ගිනි ගන්නා බවට වැලිගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත වහා ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීන් හා ප්‍රදේශවාසීන් එක්ව ගින්න නිවා දැමීමට කටයුතු කර ඇත.

ගින්න හටගන්නා ගන්නා අවස්ථාවේ නිවැසියන් නිවසේ සිට නොමැති අතර ගින්න හේතුවෙන් නිවසේ පහත මාලයේ දේපල හානි පමණක් සිදුව ඇත. ගිනි ගැනීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. වැලිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - නව කුරුඳුවත්ත පොලිස් වසම.

2024.05.22 වන දින උදෑසන කාලයේදී නව කුරුඳුවත්ත පොලිස් වසමේ බෙරවිල ගම්පොල මාර්ගයේ උඩහේන්තැන්න ප්‍රදේශයේදී බෙරවිල දෙස සිට ගම්පොල දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථ රථයක ගමන් කල දැරියක් බස් නැවතුමෙන් බැස බස් රථය ඉදිරියෙන් පාර මාරුවීමට යන අවස්ථාවේ බස් රථය ඉදිරියට ධාවනය කිරීමට යන අවස්ථාවේ දැරිය බස් රථයේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ දැරිය නව කුරුඳුවත්ත රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 10 ක්වූ මල්ගොල්ල ප්‍රදේශයේ පදිංචි පාසල් සිසුවියකි.**

මෘත ශරීරය ගම්පොල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට අදාල බස් රථයේ රියදුරු හා රියදුරු සහයක අත්අඩංගුවට ගෙන ඇත. නව කුරුඳුවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - මාතර පොලිස් වසම.

2024.05.22 වන දින රාත්‍රී කාලයේදී මාතර පොලිස් වසමේ මාතර අකුරැස්ස මාර්ගයේ ගොඩගම ප්‍රදේශයේදී මාතර දෙස සිට අකුරැස්ස දෙසට ධාවනය වූ වෑන් රථයක පදික මාරුව මතින් මාර්ගය හරහා ගමන් ගත් පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදික කාන්තාව මාතර රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කරාපිටිය රෝහල වෙත ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 72 ක්වූ ගොඩගම, මාතර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට අදාල වෑන් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මාතර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**